# ධර්ම සන්නිවේදනයෙහිලා භාෂාවේ ඇති සීමාවන්: 'අතක්කාවචර' සංකල්පය පිළිබඳ ඥානවිභාගාත්මක විමර්ශනයක්

රොටුඹ ධම්මසිරි හිමි[1], කරපික්කඩ සෝභිත හිමි[2]

## හැඳින්වීම

මානව ශිෂ්ටාචාරයේ ආරම්භයේ සිට ම අදහස්, පුද්ගල හැඟීම් සහ සංකල්ප හුවමාරු කරගැනීමේ මෙන්ම ඥානය ගබඩා කර තැබීමේ ප්‍රධානතම සහ සන්නිවේදනාත්මක මෙවලම වශයෙන් භාෂාව හැඳින්විය හැකි ය. සන්නිවේදන කර්තව්‍යයේ දී මෙන් ම ඥානය ලබා ගැනීමේ දී හා ලබා දීමේ දී ද භාෂාව මඟින් වැදගත් කාර්යභාරයක් ඉටුකරයි. කෙසේ වුවද, බුදුසමයට අනුව භාෂාව යනු පරමාර්ථ ස්වභාවයක් සහිත වූවක් නොවන අතර, හුදු මානව අවශ්‍යතාවන් උදෙසා සමාජ සම්මුතියෙන් ගොඩනඟා ගත් සංකේත පද්ධතියක් හෙවත් 'පඤ්ඤත්ති' සමුදායකි. මේ අනුව භාෂාව පුද්ගල අවශ්‍යතා මත නිර්මාණය වී සන්නිවේදනයේ ප්‍රධාන ක්‍රියාකාරීත්වයක් දරන බව දැකිය හැකි ය.

මානව භාෂාව මූලික වශයෙන් ම සැකසී ඇත්තේ පංචේන්ද්‍රිය ගෝචර අත්දැකීම් සහ ලෞකික ලෝකයේ සංකල්ප හා දැනුම පදනම් කරගනිමිනි. එබැවින්, ඉන්ද්‍රිය පරාසයන්ගෙන් ඔබ්බට ගිය, සාපේක්ෂතාවාදී ලෝකය ඉක්මවා සිටින පරමාර්ථ සත්‍යය සන්නිවේදනය කිරීමේ දී භාෂාව නමැති මෙවලමට, විවිධ ගැටලුවලට හා සීමාවලට මුහුණ දීමට සිදු වේ.

පාලි සූත්‍ර සාහිත්‍යයේ දක්නට ලැබෙන දීඝනිකායේ බ්‍රහ්මජාල සූත්‍රය සහ මජ්ඣිමනිකායේ අරියපරියේසන සූත්‍රය වැනි දේශනාවන්හි දී බුදුන් වහන්සේ විසින් අවබෝධ කරගන්නා ලද ධර්මයේ සහ නිර්වාණයේ ස්වභාවය හැඳින්වීම සඳහා 'අතක්කාවචර' යන සුවිශේෂ පදය භාවිත කර තිබෙනු දැකිය හැකි ය. 'අතක්කාවචර' යන්නෙහි සරල අර්ථය වන්නේ 'හුදු තර්කයට හෝ භාෂාමය චින්තන පරාසයට ගෝචර නොවන' යන්න යි. මෙමඟින් භාෂාමය සීමාවෙන් ඔබ්බට යන ආනුභවික ස්වභාවයක් පිළිබඳ ව මූලික ව ඉස්මතු වේ. මේ අනුව මිනිසා විසින් ස්වකීය ඉන්ද්‍රිය ගෝචර සීමාව තුළ සිට සකස් කරගත් භාෂාමය වචන හරඹයන්ගෙන් පරමාර්ථය වටහා ගැනීමට උත්සාහ කිරීමේ දී හා ඒ පිළිබඳ නිර්වචනය කිරීමට උත්සාහ ගැනීමේ දී මතු වන ඥානවිභාගාත්මක ගැටලු හා එහි පවත්නා සීමා පිළිබඳ ව මෙම පර්යේෂණය තුළ දී මූලික වශයෙන් අධ්‍යයනය කෙරේ.

## පර්යේෂණ අරමුණු

මෙම පර්යේෂණයේ අරමුණු අතර,

පාලි සූත්‍ර දේශනාවන්හි 'අතක්කාවචර' සංකල්පය භාවිත වී ඇති සන්දර්භයන්

1 බෞද්ධ හා පාලි අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුරය, ශ්‍රී ලංකාව.
dhammasirihimikottawa@gmail.com

2 බෞද්ධ හා පාලි අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුරය, ශ්‍රී ලංකාව.
karapikkadasobitha@gmail.com

අධ්‍යයනය කර එහි ඥානවිභාගාත්මක අර්ථය හඳුනාගැනීම භාෂාවේ සහ තර්කනයේ පවතින සාපේක්ෂතාවාදී ස්වභාවය සහ එමඟින් පරමාර්ථ සත්‍යයට සිදුවිය හැකි බලපෑම පිළිබඳ බෞද්ධ ආකල්පය විමර්ශනය කිරීම ආදිය ප්‍රධාන වේ.

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම පර්යේෂණය ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ මූලාශ්‍රය අධ්‍යයනයක් වශයෙන් සිදු කෙරේ. මෙහි දී දත්ත රැස් කිරීම සඳහා ප්‍රධාන වශයෙන් ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය භාවිත කෙරේ. මෙහිලා භාවිත ප්‍රාථමික මූලාශ්‍රය අතර දීඝනිකායේ බ්‍රහ්මජාල සූත්‍රය, මජ්ඣිමනිකායේ අරියපරියේසන සූත්‍රය, මධුපිණ්ඩික සූත්‍රය, මූලපරියාය සූත්‍රය සහ සෙසු මූලාශ්‍රය භාවිත කෙරේ. ද්විතීයික මූලාශ්‍රය අතර ප්‍රාමාණික විද්වතුන් විසින් රචිත පර්යේෂණ කෘති, පර්යේෂණ ලිපි හා පර්යේෂණ පත්‍රිකා ඇතුළු ප්‍රමාණවත් මූලාශ්‍රය භාවිත කෙර්.

මෙහිදී දත්ත රැස් කිරීම සහ විශ්ලේෂණය කිරීම සඳහා ප්‍රධාන වශයෙන් පාඨ විශ්ලේෂණ ක්‍රමය හා සන්ධාර විශ්ලේෂණ ක්‍රමය ප්‍රධාන වශයෙන් භාවිත කෙරේ.

**සාකච්ඡාව**

සන්නිවේදනයේ දී අත්‍යවශ්‍ය මෙවලමක් වන්නේ භාෂාව යි. සාමාන්‍ය ජන සමාජයේ යම් පරිද්දෙන් සන්නිවේදන කර්තව්‍යය සඳහා භාෂාව අත්‍යවශ්‍ය වේ ද එපරිද්දෙන් ම ධර්ම සන්නිවේදනය සඳහා ද භාෂාව අතිශය වැදගත් වේ. මෙසේ භාෂාවේ ඇති වැදගත්කම නිසාවෙන් ම බුදුරදුන් විසින් "චරථ භික්ඛවෙ චාරිකං බහුජන හිතාය බහුජන සුඛාය" ආදී වශයෙන් පළමු ධර්මදූත පිරිසට අවවාද ලබාදීමේ දී "දෙසෙථ භික්ඛවෙ ධම්මං ආදිකල්‍යාණං" යනාදී වශයෙන් භාෂා භාවිතයට අදාළ කරුණු පිළිබඳ ව ද අවධාරණය කළ අයුරු හඳුනාගත හැකි ය. මෙසේ භාෂා භාවිතය හා එහි වැදගත්කම පිළිබඳව සඳහන් වන සූත්‍ර දේශනා රැසක් පෙළ තුළින් ප්‍රකට වේ. මේ අතර ම භාෂාව තුළින් සත්‍යය හා යථාර්ථය ප්‍රකාශ කිරීමේ දී මතු වන සීමාවන් පිළිබඳ ව ද බුදුසමයේ ඉතා ගැඹුරු හා ඥානවිභාගාත්මක පැතිකඩක් ඔස්සේ විග්‍රහ කොට ඇති අයුරු හඳුනාගත හැකි ය.

මූලික වශයෙන් මුල් බුදුසමයේ නිවන හා බුදුරදුන් විසින් ලබාගත් බෝධිය පිළිබඳ විග්‍රහයේ දී මජ්ඣිමනිකායේ අරියපරියේසන ආදී සූත්‍ර දේශනාවන්හි දී බුදුරදුන් විසින් සිය අවබෝධය පිළිබඳ විග්‍රහ කරනුයේ, "අධිගතො ඛො ම්‍යායං ධම්මො ගම්භීරො දුද්දසො දුරනුබොධො සන්තො පණීතො අතක්කාවචරො නිපුණො පණ්ඩිතවෙදනීයො" ආදී වශයෙනි. එනම් තමන් වහන්සේ විසින් අවබෝධ කරගත් ධර්මය ගැඹුරු, දැක්මට හා අවබෝධයට නොපහසු, ශාන්ත, ප්‍රණීත, තර්කයෙන් බැසගත නො හැකි, නිපුණ හා පණ්ඩිතයන් විසින් දත යුත්තක් වශයෙනි. මෙහි දී භාවිත කොට ඇති සුවිශේෂ වචනයක් වශයෙන් 'අතක්කාවචර' යන්න හඳුනාගත හැකි ය.

'අතක්කාවචර' යන වචනය අටුවාවේ විග්‍රහ වනුයේ "තර්කයෙන් බැසගත යුත්තක්, පැමිණිය යුත්තක්, අවබෝධ කරගත යුත්තක් නොව, නුවණින් ම අවබෝධ කළයුතු වූවක්" වශයෙනි (*අතක්කාවචරොති තක්කෙන අවචරිතබ්බො ඔගාහිතබ්බො න*

*හොති, ඤාණෙනෙව අවචරිතබ්බො*) මෙයින් අදහස් කරනුයේ හුදු අතාර්කිකත්වයක් නොව, තර්කයෙහි සහ බුද්ධියෙහි පවතින සන්නිවේදනාත්මක සීමාවයි. මිනිසා බාහිර ලෝකය තේරුම් ගන්නේ ඉන්ද්‍රියයන් හරහා ලබාගන්නා දත්ත මඟිනි. මජ්ඣිමනිකායේ මධුපිණ්ඩික සූත්‍රයට අනුව, මෙම ඉන්ද්‍රිය දත්ත මනසේ 'පපඤ්ච' ක්‍රියාවලියකට ලක් වේ. මිනිසා භාෂාව නිර්මාණය කරගනු ලබන්නේ මෙම ප්‍රපංචන ක්‍රියාවලිය පාදක කරගනිමිනි. එම නිසා භාෂාව නිතැතින්ම සාපේක්ෂ පදනමක පිහිටා පවතී (උදා: උස - මහත, හොඳ - නරක, ඇත - නැත).

දෙවනුව, නිර්වාණය වැනි පරමාර්ථ සත්‍යයක් යනු එකී සාපේක්ෂ පදනමකින් තොර වූ, සාමාන්‍ය ඉන්ද්‍රිය ක්‍රියාවලියෙන් ඔබ්බට ගිය තත්ත්වයකි. එබැවින් සාපේක්ෂ ලෝකය හැඳින්වීමට භාවිත කරන භාෂාව තුළින් පරමාර්ථ සත්‍යය විග්‍රහ කිරීමට හා ලඝු කොට දැක්වීමට යාමේ දී භාෂාව අසාර්ථක වේ. එයට හේතුව වන්නේ භාෂාව පවතිනුයේ කිසියම් සීමා සහිත බවකට අනුගතව වීම නිසාවෙනි. බුදුරජාණන් වහන්සේ අව්‍යාකෘත ප්‍රශ්න හමුවේ නිශ්ශබ්දතාව සුරැකීමට හෝ එම ප්‍රශ්න ප්‍රතික්ෂේප කිරීමට ප්‍රධානතම හේතුවක් වන්නේ භාෂාවේ පවතින මෙම ඥානවිභාගාත්මක සීමාවයි. යමෙක් 'තථාගතයන් මරණයෙන් පසු උපදී ද, නොඋපදී ද' ආදී වශයෙන් අසන ප්‍රශ්න, භාෂාවේ සීමාවන් නිසා පරමාර්ථ සත්‍යය වටහා ගැනීමට නොහැකි වීමෙන් පැන නඟින ඒවා බව පැහැදිලි වේ. එබඳු ප්‍රශ්න සඳහා පිළිතුරු ලබා දියයුත්තේ ද සම්මුති භාෂාව භාවිතයෙන් ම නිසාවෙන් ඒවාට පිළිතුරු දීමට යාමෙන් තව තවත් ගැටලු පැනනගිනවා මිස ඒවාට විසඳුමක් දැක්වීම ඉතා අපහසු වේ. එබැවින් එසේ අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු ලබා නොදෙමින් ඒවා පසෙකින් තැබීමේ ක්‍රමවේදයක් (ඨපනීය/අව්‍යාකත) බුදුරදුන් විසින් අනුගමනය කළ ආකාරය සංයුත්තනිකායේ අබ්‍යාකත සංයුත්තය, මජ්ඣිමනිකායේ චූළමාලුංක්‍ය සූත්‍රය ආදී දේශනා කෙරෙන් පැහැදිලි වේ.

තෙවනුව, භාෂාවේ සීමාවන් පැවතිය ද ධර්ම සන්නිවේදන කාර්යය තුළ දී පරමාර්ථය දේශනා කිරීම සඳහා සම්මුතිය හෙවත් භාෂාව භාවිත කිරීමට සිදු වේ. එබැවින් භාෂාව වුවද ආධානග්‍රාහීව නොගෙන හෝ අතික්‍රමණය කිරීමට උත්සාහ නොගෙන උපයෝගිතාව පමණක් සලකා භාවිත කරන ලෙස බුදුරජාණන් වහන්සේ විසින් පෙන්වා දුන් ආකාරය මජ්ඣිමනිකායේ අරණවිභංග වැනි සූත්‍ර දේශනා ඇසුරින් පැහැදිලි වේ (*ජනපදනිරුත්තිං නාභිනිවෙසෙය්‍ය, සමඤ්ඤං නාතිධාවෙය්‍ය*). එබැවින් සීමා සහිත භාෂාව භාවිත කරමින් සීමා රහිත හා ලඝු කොට දැක්වීමට අපහසු යථාර්ථයක් පිළිබඳ දේශනා කිරීමේ දී බුදුන් වහන්සේ විසින් උපාය කෞශල්‍යය භාවිත කරමින් භාෂාව හැසිර වූ අයුරු ත්‍රිපිටකයෙහි විවිධ ස්ථානවලින් හඳුනාගත හැකි ය. උදාහරණයක් වශයෙන් රහතුන්ගේ ස්වභාවය පිළිබඳ ව දැක්වීමේ දී නිවී ගිය පහනකට උපමා කිරීම (*නිබ්බන්ති ධීරා යථායම්පදීපො*) හඳුනාගත හැකි ය. මෙහි දී ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය තුළින් මූලික දැනුමක් ලබන පුහුදුන් පුද්ගලයාට, අතීන්ද්‍රිය ප්‍රත්‍යක්ෂයෙහි ද පරතෙරට පත් රහතන් වහන්සේ නමකගේ භවගාමී ස්වරූපය පිළිබඳ සරල උපමාවක් ඇසුරින් දේශිත අයුරු වටහාගත හැකි ය.

**නිගමනය**

මේ අනුව මුල් බුදුසමය තුළ මානව සන්නිවේදනයේ දී සහ ඥානගවේෂණයේ දී භාෂාවට හිමි ප්‍රායෝගික වටිනාකම සම්පූර්ණයෙන් ම ප්‍රතික්ෂේප නොකරන නමුත්, එහි පවතින සීමාවන් පිළිබඳ සාකච්ඡා කළ අයුරු හඳුනාගත හැකි ය. මෙහි දී ප්‍රධාන වශයෙන් 'අතක්කාවචර' යන සංකල්පය වැදගත් වන අතර එමගින් පෙන්වා දෙන්නේ සත්‍යය අවබෝධ කරගැනීම යනු හුදු ශබ්ද හෝ සංකේතවලට පමණක් සීමා වූ, ආගමික හෝ තාර්කික හරඹයක් නොව, භාෂාවෙන් විග්‍රහ කළ නොහැකි, එහි සීමාවන්ගෙන් එපිට පවතින ඍජු ප්‍රත්‍යක්ෂය හා සබැඳි ආනුභවික තත්ත්වයක් වශයෙන් දැක්වෙන අයුරු තහවුරු වේ.

නමුත් භාෂාවේ විවිධ සීමාවන් පැවතිය ද පරමාර්ථය පිළිබඳ සාකච්ඡා කිරීමේ දී හෝ යථාර්ථය පිළිබඳ දේශනා කිරීමේ දී මෙම සම්මුතිය භාවිත නොකර යථාර්ථය පිළිබඳ ව සාකච්ඡා කිරීමට හැකියාවක් නොමැත. එබැවින් භාෂාව සීමා සහිත වුව ද උපයෝගිතාවාදී පදනමක සිට භාෂාව භාවිත කිරීමට බුදුරදුන් විසින් සිය ශ්‍රාවකයක් මෙහෙය වූ අයුරු මුල් සූත්‍ර දේශනා ඇසුරින් හඳුනාගත හැකි ය.

මේ අනුව පුද්ගලයා විසින් සත්‍යය සෙවීමේ දී හා ඥාන ගවේෂණයේ දී භාවිත කරන භාෂාමය සහ සංකල්පීය විවිධත්වයන්ට යටින් පවතින පොදු මානව ඥානවිභාගාත්මක සීමාවන් තේරුම් ගැනීමට 'අතක්කාවචර' සංකල්පය ඉතා වැදගත් වන අයුරු මෙමගින් හඳුනාගත හැකි ය. මේ අනුව බෞද්ධ ඥානවිභාගය තුළ දී වචන හරහා සත්‍යය සෙවීම නොව, වචනවල සීමාවන් දැකීමෙන්, භාෂාවට සීමා නොවී සත්‍යය සාක්ෂාත් කරගැනීම සඳහා පුද්ගලයා මෙහෙයවන අයුරු හඳුනාගත හැකි ය.

**ප්‍රමුඛ පද** - අතක්කාවචර, අව්‍යාකත, පරමාර්ථ සත්‍යය, බෞද්ධ ඥානවිභාගය, භාෂාවේ සීමාවන්

**මූලාශ්‍රය ග්‍රන්ථ**

*දීඝනිකාය I*, (2004). බු.ජ.මු. නැදිමාලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

*මජ්ඣිමනිකාය I*, (2004). බු.ජ.මු. නැදිමාලඃ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

ජයතිලක, කේ.එන්. (2003). *මුල් බුදුසමයේ ඥාන විභාගය.* (පරිඃ තිලකරත්න, හේ.මු). කොළඹ 10ඃ ඇස් ගොඩගේ ප්‍රකාශකයෝ.

රාජපක්ෂ, ඩී.එම්. (2016). *සංශයවාදය හා ඥානයෙහි සීමා, බෞද්ධ දාර්ශනික විග්‍රහයක්.* ගොඩගේ ප්‍රකාශකයෝඃ කොළඹ.

*සිංහල විශ්වකෝෂය 13.* (2013). ධම්මගරු හිමි.යූ. සංස්ඃ හෙට්ටිආරච්චි ඩී.ඊ. බත්තරමුල්ලඃ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

Karunathilaka, N.M.B.P.K (2018). *A Philosophical Study on the Buddhist Conception of Language and Reality.* Available at SSRN: https://ssrn.com/abstract=3666962 or http://dx.doi.org/10.2139/ssrn.3666962